සියලු ම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved]

# හෝමාගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2016

## ගණිතය - 6 ශ්‍රේණිය

නම : ................................................................................................ කාලය පැය 02 යි.

◈ I කොටසේ ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයෙහිම පිළිතුරු සපයා II කොටසේ උත්තර පත්‍රයට අමුණන්න.

### I කොටස

*ලකුණු (2 × 20 = 40)*

**01.** හිස්තැන් පුරවන්න.

$$\begin{array}{r} 2\;3\;\square \\ +\,4\;7\;8 \\ \hline 7\;\square\;1 \end{array}$$

**02.** මෙම වසරේ සිංහල අළුත් අවුරුද්දේ ආහාර අනුභවය යෙදී තිබුනේ අප්‍රේල් 13 වන දින ප.ව. 8.54ට ය. එම වේලාව සම්මත ආකාරයෙන් ලියන්න.

**03.** 743 ආසන්න 10 ගුණාකාරයට වටයන්න.

**04.** 3 , – 4 , 0 , – 1 , 5 යන සංඛ්‍යා ආරෝහණ පටිපාටියට ලියන්න.

**05.** 1 සිට 10 තෙක් ඇති ප්‍රථමක සංඛ්‍යා සියල්ල ලියන්න.

**06.** 4 , 7 , 0 , 3 යන ඉලක්කම් භාවිත කර ලිවිය හැකි,

To download past papers visit
www.vajirapani.blogspot.com


(i) විශාලම සංඛ්‍යාව කුමක්ද?

(ii) කුඩාම සංඛ්‍යාව කුමක්ද?

**07.** 20 හි සාධක 4 ක් ලියන්න.

**08.** (i) වෘත්තය මත පිහිටි ලක්ෂ්‍යයක් නම් කරන්න.


(ii) වෘත්තය තුල වූ ලක්ෂ්‍යයක් නම් කරන්න.




**09.** 785□ යන ඉලක්කම් හතරකින් යුත් සංඛ්‍යාව ඉතිරි නැතිව 5 න් බෙදෙයි නම් හිස්තැනට සුදුසු ඉලක්කම් දෙක තිත්ඉරි මත ලියන්න. ........................ ...........................

**10.** හිස්තැන් පුරවන්න. $\frac{3}{4} = \frac{3 \times 5}{4 \times \square} = \frac{\square}{20}$

**11.** රූපයේ පාට කළ කොටස



(i) භාගයක් ලෙස ලියන්න.

(ii) දශමයක් ලෙස ලියන්න.

**12.** සුළු කරන්න. $\frac{11}{15} - \frac{4}{15}$

**13.** හිස්තැන්වලට ගැලපෙන පරිදි $>$ හෝ $<$ ලකුණ යොදන්න.


(i) $\frac{1}{3}$ ...... $\frac{1}{5}$ (ii) $\frac{1}{8}$ ...... $\frac{3}{8}$

**14.** එකතු කරන්න.

| | *l* | *ml* |
|---|---|---|
| | 8 | 455 |
| + | 5 | 725 |
| | | |


To download past papers visit
www.vajirapani.blogspot.com

**15.** රූපයේ පරිමිතිය සොයන්න.




**16.** පළමු සංයුක්ත සංඛ්‍යා දෙක ලියන්න.

**17.** (i) මෙහි නිරූපණය වන්නේ කී වන වර්ග සංඛ්‍යාවද?



(ii) එහි වටිනාකම කීයද?

**18.** අගය සොයන්න.

| | |
|---|---|
| | 28.63 |
| + | 15.73 |
| | |

**19.** තත්පර 240 ක් යනු මිනිත්තු කීයක්ද?

**20.** පොත් 2 460 ක්, පොත් 20 බැගින් වූ පාර්සල් කීයකට වෙන් කළ හැකිද?

## II කොටස

◈ පළමුවන ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

◈ පළමු ප්‍රශ්නයට ලකුණු **16** ක් ද අනෙක් ප්‍රශ්න සඳහා ලකුණු **11** බැගින් ද හිමි වේ.

**01.** ඔබ විසින් පන්ති කාමරයේදී අධ්‍යයනය කළ ඝන වස්තු පාඩම හා සම්බන්ධ ක්‍රියාකාරකම් මතකයට නගා ගනිමින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(a) (i) සෑම මුහුණතක්ම සමචතුරස්‍ර හැඩය ගත් ඝන වස්තුව කුමක්ද? *(ල. 1)*

(ii) එම ඝන වස්තුව සෑදීමට යොදා ගන්නා පතරමක් ඇඳ දක්වන්න. *(ල. 3)*

(iii) අවට පරිසරයේ දැකිය හැකි ඉහත ඝන වස්තුවේ හැඩය ඇති වස්තු 2ක නම් ලියන්න. *(ල. 2)*


(b) (i) ඔබ ඉගෙන ගත් චතුරස්‍ර වර්ග සියල්ල නම් කරන්න. *(ල. 4)*

(ii) ඔබ පන්ති කාමරයේදී සකස් කළ ඝන වස්තුවල ආකෘති මතකයට නගා ගනිමින් පහත වගුව සම්පූර්ණ කරන්න. *(ල. 6)*

| ඝන වස්තුවේ නම | මුහුණත් ගණන | දාර ගණන | ශීර්ෂ ගණන |
|---|---|---|---|
| ඝනකාභය | | | |
| සවිධි චතුස්තලය | | | |

To download past papers visit www.vajirapani.blogspot.com

**02.** (a) (i) පහත දැක්වෙන රූපය පිළිතුරු පත්‍රයේ පිටපත් කරගෙන එහි $\frac{3}{4}$ ක් පාට කර පෙන්වන්න. *(ල. 2)*



(ii) $\frac{2}{3}$ ට තුල්‍ය භාග දෙකක් ලියන්න. *(ල. 2)*

(iii) $\frac{1}{5}$ , $\frac{1}{3}$ , $\frac{1}{7}$ යන භාග ආරෝහණ පටිපාටියට ලියා දක්වන්න. *(ල. 2)*


(b) (i) සුළු කරන්න. $\frac{1}{3} + \frac{1}{9}$ *(ල. 2)*

(ii) පියකු තමා සතුව තිබූ මුදලකින් $\frac{5}{9}$ ක් පුතුට ද $\frac{1}{3}$ ක් දුවට ද ලබා දුන්නේය. දුවට වඩා පුතුට ලැබුණු මුදල් කොටස කොපමණද? *(ල. 3)*

**03.** (a) එක්තරා දිනක ලෝකයේ ස්ථාන 4ක පැවති උෂ්ණත්වයන් කිහිපයක් සෙල්සියස් අංශකවලින් පහත දක්වා ඇත.

A → 3 , B → (−3) , C → 0 , D → 5

(i) පහත දී ඇති සංඛ්‍යා රේඛාව පිටපත් කරගෙන එම උෂ්ණත්වයන් ඒ මත ලකුණු කරන්න. *(ල. 4)*




(ii) එම උෂ්ණත්වය ආරෝහණ පටිපාටියට ලියා දක්වන්න. *(ල. 2)*

(b) (i) −1 හා 2 අතර ඇති නිඛිල සියල්ල ලියා දක්වන්න. *(ල. 2)*

(ii) < හෝ > අසමානතා ලකුණු නිවැරදිව යොදමින් හිස්තැන් පුරවන්න.

−5 ...... 3 , −2 ...... −4 , 0 ...... −1 *(ල. 3)*

**04.** (a) (i) 0.753 යන සංඛ්‍යාව වචනයෙන් ලියා දක්වන්න. (ල. 2)

(ii) 43.125 යන සංඛ්‍යාවේ 2 ඉලක්කමින් නිරූපණය වන අගය කීයද? (ල. 2)

(iii) 14.32 යන සංඛ්‍යාව ගණක රාමුවකින් නිරූපණය කරන්න. (ල. 3)

(b) (i) සැරසිල්ලක් සඳහා කපාගත් කම්බි කැබැලිවලින් මුල් කම්බි කැබැල්ලේ දිග 12.8 cm ක් වන අතර, දෙවන කම්බි කැබැල්ලේ දිග 8.9 cm ක් වේ. කම්බි කැබලි දෙකෙහි මුළු දිග කොපමණද? (ල. 2)

(ii) ඉහත කම්බි කැබලිවල පළමු කැබැල්ල දෙවැන්නට වඩා කොපමණ ප්‍රමාණයක් දිගින් වැඩිද? (ල. 2)

**05.** (a) සුළු කිරීමෙන් තොරව පහත දැක්වෙන එක් එක් ප්‍රකාශනයේ අගය ඔත්තේ ද ඉරට්ට ද යන්න සඳහන් කරන්න.

(i) $54 + 66$ (ii) $77 - 24$ (iii) $65 \times 14$ (ල. 3)


(b) (i) 50 සිට 100 දක්වා ඇති සමචතුරස්‍ර සංඛ්‍යා සියල්ල ලියන්න. (ල. 2)

(ii) කඩයක මාළු ටින් ගබඩා කර තිබුණේ ත්‍රිකෝණ සංඛ්‍යා රටාවකටය. එහි පහළම පේළියේ ටින් 5 ක් තිබුණේ නම් එම රටාව ඇඳ පෙන්වන්න. (ල. 3)

(iii) එහි ඇති මුළු මාළු ටින් ගණන කීයද? (ල. 2)

(iv) එම රටාවෙන් කී වන ත්‍රිකෝණ සංඛ්‍යාව නිරූපණය වේද? (ල. 1)

**06.** (a) පහත රූපයේ එක් එක් අක්ෂරයෙන් දක්වා ඇති කෝණ වර්ගය නම් කරන්න. (ල. 5)




To download past papers visit
www.vajirapani.blogspot.com

(b) පහත දී ඇති සංඛ්‍යා, කාණ්ඩ තුනකට වෙන් කර ඒවා හැඳින්වීමට සුදුසු නම් යෝජනා කරන්න. (ල. 6)

$-3\ ,\ 2\ ,\ \frac{2}{3},\ 1\ ,\ -2$

$\frac{3}{4},\ -5\ ,\ \frac{1}{2},\ 7\ ,\ \frac{1}{5}$

**07.** (a) (i) 4356218275 යන සංඛ්‍යාව සම්මත ආකාරයෙන් ලියන්න. (ල. 2)

(ii) එහි සංඛ්‍යා නාමය ලියන්න. (ල. 2)

(b) (i) එක්තරා පාසලක සිටි පිරිමි ළමුන් ගණන 1423 කි. ගැහැණු ළමුන් ගණන 1522 කි. පාසලේ සිටින මුළු ළමුන් ගණන කීයද? (ල. 2)

(ii) පොත් 248ක් එක් අයකුට 8 බැගින් කීදෙනකුට බෙදා දිය හැකිද? (ල. 2)

(iii) සුළු කරන්න. $3458 \times 34$ (ල. 3)